# ඉන්දියන් සාගර කලාපයේ ආරක්ෂාව ගැන පාත්ෆයින්ඩර් වාර්තාව ඉන්දීය විදේශ ඇමැතිට

**ඉන්දියන් සාගර කලාපයේ ආරක්ෂාව සම්බන්ධයෙන් පාත්ෆයින්ඩර් පදනම පළ කළ අධ්‍යයන වාර්තාවේ පිටපතක් එහි නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා පසුගියදා මෙරටට පැමිණි ඉන්දීය විදේශ අමාත්‍ය ආචාර්ය එස්. ජේයශංකර් මහතා වෙත පිරිනැමීය. ඉන්දීය සාගර කලාපීය ආරක්ෂාව ගැන අවධානය යොමු කරන දින තුනක විශේෂ ඔන්ලයින් සංවාදයක් සංවිධානය කළ පාත්ෆයින්ඩර් පදනම එහි අවසන් නිල වාර්තාව නිකුත් කරන ලද අතර රටවල් තිස්පහක රාජ්‍ය නියෝජිතයෝ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, ක්ෂේත්‍රයේ විශේෂඥයන්, බුද්ධි මණ්ඩල නියෝජිතයන් සහ තෝරාගත් සංවිධානවල නියෝජිතයන් එකසිය පනහකට වඩා මෙයට සහභාගී වූහ. දෙස් විදෙස් මාධ්‍ය වලට පවා එය විවෘත කරන ලදී.**

සමුද්‍ර ආරක්ෂාව හා නාවික ගමනාගමනයේ නිදහස තේමාව කරගෙන සිංගප්පූරු විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු අධ්‍යයන අංශයේ මහාචාර්ය සී. රාජමෝහන් මහතා මෙම සමුළුවේ පළමු සැසිය මෙහෙයවන ලද අතර දෙවැනි සැසිය, ආසියානු කලාපයේ සබඳතා තරකිරීම මැයෙන් දකුණු ආසියානු වැඩසටහනේ අධ්‍යක්ෂක ආචාර්ය ෆෙඩ්‍රික් ග්‍රෙයා මහතාද තුන්වන සැසිය ජාත්‍යන්තර සාමය බලවත් කිරීම මැයෙන් හිටපු තානාපති සහ දකුණු හා මධ්‍යම ආසියානු රටවල් සඳහා වූ ඇමරිකානු සහකාර ලේකම් රොබට් ඕ බ්ලේක් මහතා මෙහෙයවීය. ඉන්දියාව, රුසියාව, ඇමරිකාව, සිංගප්පූරුව, දකුණු අප්‍රිකාව, ඔස්ට්‍රේලියාව, චීනය, ජපානය සහ ශ්‍රී ලංකාවේ නියෝජිතයෝ මෙම සැසිවලදී සජීවී අන්තර්ජාල සම්බන්ධතාවලින් සිය නිබන්ධන ඉදිරිපත් කළහ. පාත්ෆයින්ඩර් පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක සහ ඉන්දියාවේ රාජ්‍ය තාන්ත්‍රිකයකු වන ශිවශංකර් මෙනන් යන මහත්වරු මෙම සමුළුවේ සම සභාපතිධුර හෙබවූහ. www.pathfinderfoundation.org වෙබ් අඩවියෙන් මෙම් වාර්තාව කියැවිය හැකිය.

